# <u>බස්නාහිර පළාත් රාජ්‍ය ආයතනවල කාර්ය සාධනය ඇගයීමේ තරඟාවලිය - 2024</u>

## <u>ඇගයීම් ක්‍රමවේදය සඳහා ලකුණු යෙදීමේ පොදු උපදෙස්</u>

බස්නාහිර පළාත් රාජ්‍ය ආයතනවල කාර්ය සාධන තරඟාවලිය 2024.07.29 දිනැති පාලන චක්‍රලේඛ අංක 01/2024 අනුව කාණ්ඩ 12ක් යටතේ ඇගයීම් කටයුතු සිදුකිරීමට නියමිතය.

2) කාර්ය සාධන තරඟාවලිය සඳහා ලියාපදිංචිවීමට ලබා දී තිබූ කාලසීමාව තුලදී අන්තර්ජාලය ඔස්සේ ලියාපදිංචි වූ ආයතන 1060ක් මෙම තරගාවලිය සඳහා සුදුසුකම් ලබා ඇති අතර එම ආයතන ප්‍රධාන පියවර 03ක් යටතේ ඇගයීම් ක්‍රියාවලියට භාජනය කරනු ඇත.

I. **පලමු අදියර**

- මෙහිදී ඔබ ආයතනය මඟින් කාර්ය සාධනය මැන බැලීම සඳහා භාවිතා වන ප්‍රශ්නාවලිය ඇතුලත් ගූගල් පෝරමය ප්‍රධාන ලේකම් කාර්යාලයේ පාලන අංශයේ වෙබ් අඩවිය හරහා (www.adm.chiefsec.wp.gov.lk/si ) බාගත කර ගත යුතුය.
- එලෙස ලබා ගත් ගූගල් පෝරමය ඔබ ආයතනය අදාල වන නිර්ණායක කාණ්ඩය හා ඔබ ආයතනයට ලබා දී ඇති කේත අංකය යටතේ නිවැරදිව සම්පූර්ණ කර 2024.09.30 දිනට ප්‍රථමව නැවත අප වෙත යොමු කල යුතුය.

II. **දෙවන අදියර**

- මෙහිදී ඔබ විසින් තොරතුරු ඇතුලත් කරන ලද ගූගල් පෝරමය ඔබ ආයතනයේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියා වෙත යොමු කර ඔබ ආයතනය සම්බන්ධයෙන් වන ආසන්නතම අධික්ෂණ නිලධාරියාගේ ඇගයීම ලබා ගැනිම සිදු කරයි.
- එම ඇගයීමෙන් පරිසාදිත මට්ටම ලකුණු 50%ට වඩා වැඩි අගයන් ලබා ගන්නා ආයතන අවසන් අදියර සඳහා සුදුසුකම් ලබයි.
- සුදුසුකම්ලත් ආයතන නාමලේඛණය 2024.10.15 දින www.adm.chiefsec.wp.gov.lk/si පල කිරිමට බලාපොරොත්තු වන අතර පල කල දින සිට දින 03ක කාලයක් අභියාචනා ඉදිරිපත් කිරිමට ඉඩකඩ සලසා දි ඇත. එසේ ඉදිරිපත් කරන අභියාචනා ඊමේල් පණිවිඩයක් ඔස්සේ 2024.10.18ට දිනට පෙර යොමු කල යුතුය.එදිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලැබේ.

III. **අවසන් අදියර**

- අවසන් අදියර වන මෙහිදි බාහිර විනිශ්චය මණ්ඩලයන් මඟින් ස්ථානීය පරික්ෂාවට ලක් කර ලකුණු ලබාදිම සිදු කිරිමට බලාපොරොත්තු වන අතර එම විනිශ්චය මණ්ඩලයේ තොරතුරු පසුව ලබා දිමට කටයුතු කෙරේ.

3) බස්නාහිර පළාත් කාර්ය සාධන තරඟාවලියේ ඇගයීම් පත්‍ර සම්පූර්ණ කිරිමේදි හෝ ගූගල් පෝරමය බාගත කර ගැනිමේදී යම් ගැටලුවක් තිබේ නම් වැඩිදුර තොරතුරු සහකාර ප්‍රධාන ලේකම්(පාලන), නදීෂා ඩී සපරමාදු මිය, 0112092608/ 0717696636 හා සහකාර ප්‍රධාන ලේකම්(පාලන) ,ලක්මාල් රූපසිංහ මහතා , 0112092609 / 0719202838 අමතා ලබා ගත හැකි බවද කාරුණිකව දන්වමි.